# ගම්බද පාසල්වල තුන්වන ප්‍රධාන අවධියෙහි ඉගෙනුම ලබන සිසුන්ට මව්බස විෂය ආශ්‍රිත කියවීම හා ලිවීම පිළිබඳ ප්‍රවීණතාවය ලැබීමේදී පවුල් පරිසරය බලපාන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය.

එච්. ගුණපාල,
ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා (සම්මාන),
(ම. අ. වි. පී),
ශාස්ත්‍රවේදී,
(පේරාදෙණිය වි. වි.)
අධ්‍යාපන ඩිප්ලෝමා විශිෂ්ට සම්මාන.
(පේරාදෙණිය වි. වි.)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති
උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය.

UCLIB
551083

2009-11-17,
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 03.

ලියා පදිංචි අංකය : 2002/M. Phil/ 03.

## සංක්ෂිප්තය

සෑමට අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් සම අධ්‍යාපන අවස්ථා සැලසීම කෙරෙහි ශ්‍රී ලංකාව ඉමහත් උනන්දුවක් දක්වයි. එහෙත් විවිධ පරිසර විෂමතාවල බලපෑම නිසා මේ සම්බන්ධයෙන් ගැටලු මතුවන බව පෙනේ. විවිධ සමාජීය පරිසර අතරින් පාසල මෙන්ම පවුල් පරිසරයද අධ්‍යාපන අවස්ථා කෙරෙහි බලපාන වැදගත් සාධක වේ. දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පාසල හා නිවස යන දෙකම එකසේ වැදගත් වේ. දරුවන් පාසලේදී ලබන අධ්‍යාපනය වඩාත් සාර්ථක වන්නේ ඔවුන්ට නිවසේ පරිසරයෙන් ලැබෙන අනුබලය හා දිරිගැන්වීම අනුවය. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන කටයුතු වලට දෙමාපියන් හවුල්කර ගැනීමට 1930 ගණන්වල සිට විවිධ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ප්‍රයත්න දරනු ලැබුවද තවමත් බොහෝ පාසල්වල එම සම්බන්ධතා ප්‍රමාණවත් අයුරුන් ගොඩනැගී ඇතැයි කිව නොහැකිය. 1992 නිකුත් කරන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වර්තාව මගින්ද පාසල් සම්බන්ධයෙන් දෙමාපිය සහාගිත්වය අප්‍රමාදව ගවේෂණය කළ යුතු ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වා දී ඇත. වර්තමානයේ අධ්‍යාපනය අයෝජනයක් ලෙස සැලකෙන බැවින් සම්පත් නාස්තිය අවමකර අධ්‍යාපනයේ උපරිම ප්‍රතිලාභ සිසුන්ට අත්පත් කර දීමට පියවර ගැනීම සඳහා ගම්බද පාසල්වල තුන්වන ප්‍රධාන අවධියේ පසුවන දරුවන්ගේ කියවීම ලිවීම කෙරෙහි පවුල් පරිසරය බලපාන ආකාරය පිළිබඳව විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය.

අධ්‍යාපනය අතර ඇති සම්බන්ධය පිළිබඳව කර ඇති දේශීය හා විදේශීය අධ්‍යයනයන්ගේ අනාවරණ මෙම අධ්‍යයනයටද අදාළ කර ගත් අතර ප්‍රධාන අරමුණු පහක් ඔස්සේ අධ්‍යයනය සැලසුම් කරන ලදි. කියවීම හා ලිවීමේ ප්‍රවීණතාවය කෙරෙහි දෙමාපියන්ගේ අධ්‍යාපනික හා සමාජ ආර්ථික තත්ත්වය අතර සම්බන්ධතාවයක් පවතීදැයි විමසා බැලීම, කියවීම, ලිවීම ප්‍රවීණතාවය හා නිවසේ ඉගෙනුම් පරිසරය අතර සම්බන්ධතාවයක් පවතීදැයි විමසා බැලීම, කියවීම හා ලිවීමේ ප්‍රවීණතාවය කෙරෙහි දෙමාපිය ආකල්ප හා අපේක්ෂණ අතර සම්බන්ධතාවයක් පවතී දැයි විමසා බැලීම, කියවීම හා ලිවීම ප්‍රවීණතාව කෙරෙහි දෙමාපියන් පාසල සමඟ දක්වන සම්බන්ධතාවයේ බලපෑමක් ඇත්දැයි විමසා බැලීම, කියවීම හා ලිවීමේ ප්‍රවීණතාවය කෙරෙහි පාසල් වර්ගය අතර සම්බන්ධතාවයක් පවතීදැයි විමසා බැලීම එම අරමුණුවලට අයත් ය.

අධ්‍යයනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා දත්ත රැස්කිරීමට කෑගල්ල දිස්ත්‍රික්කයේ රජයේ පාසල් 20 ක තුන්වන ප්‍රධාන අවධියේ සිසුන් 400 ක් හා ඔවුන්ගේ දෙමාපියන් 400

ක්ද නියැදියට අයත් වූ අතර විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ ප්‍රශ්නාවලි, ශිෂ්‍ය සාධන පරීක්ෂණ මගින් දත්ත රැස්කෙරිණි. ප්‍රතිශත හා සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම මගින් දත්ත විශ්ලේෂණය සිදු කෙරිණි. අවශ්‍ය අවස්ථාවල ප්‍රස්තාර හා රූප සටහන්ද යොදා ගැණින. පර්යේෂණය තුලින් අනාවරණය වූ කරුණු අනුව පවුල් පරිසරය ආශ්‍රිත විචල්‍ය සිසුන්ගේ කියවීම, ලිවීම, ප්‍රවීණතාව සමග සම්බන්ධතා දක්වන බව නිගමනය විය.

සිසුන්ගේ කියවීම, ලිවීම කෙරෙහි එක් එක් විචල්‍යයේ බලපෑම ප්‍රමාණාත්මකව වෙනස් විය. මවගේ හා පියාගේ අධ්‍යාපන මට්ටම පියාගේ රැකියා තත්ත්වය, පවුලේ සමාජය ආර්ථික තත්ත්වය, නිවසේ ඇති අධ්‍යාපන සම්පත් හා දෙමාපිය සුපරීක්ෂණය සිසුන්ගේ කියවීම, ලිවීම කෙරෙහි ප්‍රබල බලපෑම් කළ විචල්‍ය වූ අතර, දෙමාපිය ආකල්ප හා අපේක්ෂණ දෙමාපිය පාසල හා ප්‍රජාව සමග දක්වන සබදතා සිසුන්ගේ කියවීම ලිවීම කෙරෙහි අඩුබව හෙළිවිය. සිසුන්ගේ ප්‍රවීණතාවය තීරණය වීම කෙරෙහි පාසල් නියෝජනය කරන දෙමාපියන්ගේ අධ්‍යාපන, සමාජ, ආර්ථික තත්ත්වය හා නිවසේ ඉගෙනුම් පරිසරය හේතු විය. ඒ අනුව පවුලේ අධ්‍යාපනික, මූල්‍ය, සංස්කෘතික හා සමාජ ප්‍රාග්ධනය විවිධ ප්‍රමාණයෙන් සිසුන්ගේ ප්‍රවීණතාව කෙරෙහි බලපාන බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. ඒ අනුව පවුල් පරිසරයේ බහුවිධ බලපෑම් සංකල්පය (Multidimensional Influences of Family Environment) සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතියට බොහෝ දුරට ක්‍රියාත්මක වන බව නිගමනය කළ හැකිය.

පාසල හා දෙමාපියන් අතර සම්බන්ධතාව වර්ධනය කිරීම සඳහා පාසල් මට්ටමින් කලාපීය මට්ටමින් හා ජාතික මට්ටමින් ගත හැකි පියවරද පවුල් පරිසරයේ ඇතිවන අහිතකර බලපෑම් අවම කර සිසුන්ගේ ප්‍රවීණතාව නැංවීම සඳහා දිළිඳු දෙමාපියන්ගේ ආර්ථිකය නගා සිටුවීමට පියවර ගැනීමත් අවශ්‍ය උදව් ලබා දිය යුතු ආකාරය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම කර වැඩි ඵලදායිතාවයක් ලබා ගත හැකි ලෙස රාජ්‍ය මට්ටමින් හා පාසල් මට්ටමින් ගත හැකි පියවර යෝජනා ඉදිරිපත් කරමින් පර්යේෂණ කාර්ය නිමකරන ලදි.

අනාගත ලෝකයට සාර්ථක ලෙස මුහුණ දිය හැකි දරු පරපුරක් විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් බිහිකර ගැනීමේ කාර්යයේදී දෙමාපිය සහයෝගය අවශ්‍ය වනු ඇත. එකී සහයෝගය උපරිම ලෙස වර්ධනය කර ගැනීම සඳහා මෙම පර්යේෂණය තුළින් හෙලිකරගන්නා ලද තොරතුරු ඵලදායක ලෙස දායක වේ යැයි පර්යේෂකයා අපේක්ෂා කරයි.

# Abstract

Sri Lanka accepts education as a human right and gives prominence to provide equal opportunities with the object of providing education for all. Due to various socio-environmental differences it is evident that various problems have arisen in relation to provision of education. Out of various social environments, the school environment as well as home environment have become major factors effecting the provision of educational opportunities. Both the school and the home play a dominant role in children's education. It's the home environment that influences and encourages children to reach the maximum benefits of education in the school.

Since 1930's a great effort had been taken by various educational refoms to get the support of the parents for the educational affairs in Sri Lankan schools. But it's, impossible to state that support of the parents in educational affairs in most of the schools has not yet been established sufficiently.

According to the 1st report of the National Educational Commission in 1992, Stated that the parents participation in school affairs need to be investigated.

As education is treated as an investment at present a special emphasis is given to reach the maximum benefits of education, This study mainly examines how the home environment influences the reading and writing skills of the children in 3rd key stage in rural schools in order to minimize the wastage of resources.

Local and foreign studies that reveal the relationship between the social and economic factors in home and education is discussed in this study and 4 objectives are included in the present study. The objectives include the following.

(i) Examination of the correlation between proficiency in literacy and educational and socio background of parents.

(ii) Examination of the correlation between the educational background at home and children's literacy.

(iii) Study the attitudes and beliefs of parents on literacy of children.

(iv) Study the influence of the relationship that parents maintain with the school on the children's learning environment.

(v) Study the relationship between the type of school and the literacy of school.

Random samples were used in the present study 20 Government schools ( of various Categories ) were selected from Kegalle district. 400 students of the 3rd key stage and their parents were selected. Data were collected using Questionnaires and student achievement experiments. Diagrams and illustrations were used when necessary in interpretation of data analysis. I t was revealed that there is a correlation between the children's achievement in literacy and the variables related to the home environment.

The educational level of the father and that of the mother and father's occupation, Socio economics situation of the family, supervision of the family were important variables influencing the children's literacy. It was revealed through analysis that the educational levels and socio economic levels of respective parents had a minor influence in children's literacy rates. The educational level and socio economic level of respective parents and the available learning environment had an influence in determining the proficiency of children. Accordingly it was revealed in the study that the educational level of the family cultural and social factors of the family have influenced the student's proficiency levels in different degrees.

Eventually the findings of the study have been able to prove multi dimensional influences at the family environment and children's educational achievement.

The study was able to highlight the measures that can be taken at the school, zonal , national levels in order to promote relationship between the school and the parents . It also discussed the negative influence of the family background and environment on children's educational achievement. Also the study was able to emphasize on measures that can be taken to upgrade the efficiency of children's education and improve the learning teaching process at the school and measures that can be adopted to enhance the awareness of all parents about how children should be assisted in their studies.

It is believed that parents support is essential in forming a group of children who can face future challenges through formal education. The survey expects that the facts revealed through the study would be helpful in order to build the maximum corporation of parents.